# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2146/30 – 2019 ඔක්තෝබර් 24 වැනි බ්‍රහස්පතින්දා – 2019.10.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2013 පෙබරවාරි මස 07 වැනි දින අංක 1796/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2013 අංක 42 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, එකී ඉඩම් කොටස් අතුරින් පහත 1 උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/19.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: WGSWD&EIP/ACQ/DW/01.
2019 ඔක්තෝබර් මස 18 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව, දෙහිවල, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල, අංක 526/ඩී, ජම්බුගස්මුල්ල, 537/බී කොහුවල ග්‍රාම නිලධාරී කොට්ඨාසවල, කළුබෝවිල, පැපිලියාන ගම්වල පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක කො 9463 හා 2018.10.09 දිනැති සංශෝධිත මුලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 58 – ෆීල්ඩ් මාවතේ, වරි. අංක 33 දරන ඉඩමේ කොටසක් – ප්‍රමාණය: හෙක්. 0.0022**

උතුරට: කැබලි අංක 6, ෆීල්ඩ් මාවතේ, වරි. අංක 306 සහ 33 දරන ඉඩම්; නැගෙනහිරට: ෆීල්ඩ් මාවතේ, වරි. අංක 33 දරන ඉඩම; දකුණට: ෆීල්ඩ් මාවත; බටහිරට: කැබලි අංක 59.

11 – 767